## රාජ්‍ය අංශයේ ධාරිතා වර්ධන ව්‍යාපෘතිය (සංඛ්‍යාන ධාරිතා වැඩි දියුණු කිරීමේ සංරචකය) - 2012

---

### 1. මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මාගේ මතය වනුයේ,

(අ) 2012 මාර්තු 31 දිනෙන් අවසන් මාස 03 ක කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2012 මාර්තු 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2012 මාර්තු 31 දිනෙන් අවසන් මාස 03 ක කාලපරිච්ඡේදය සඳහා විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2012 මාර්තු 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

2. **මූල්‍ය ප්‍රකාශන**

----------------

2.1 **මූල්‍ය කාර්ය සාධනය**

----------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 මාර්තු 31 දිනෙන් අවසන් මාස 03 ක කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘති වියදම රු.222,012 ක් වූ අතර 2012 මාර්තු 31 දිනට සමුච්චිත වියදම රු.545,026,231 ක් විය. 2012 මාර්තු 31 දිනෙන් අවසන් මාස 03 ක කාලපරිච්ඡේදය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2012 මාර්තු 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වර්ෂය | වියදම<br>2012 මාර්තු 31 දිනෙන් අවසන් මාස 03 සඳහා | 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2012 මාර්තු 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **මූලධන** | | | |
| ඉඩම | - | - | 100,000,000 |
| සිවිල් වැඩ | - | 41,662,337 | 104,018,475 |
| සැලසුම් උපදේශක | - | 3,754,330 | 14,186,940 |
| කාර්යාල උපකරණ | - | 68,115,277 | 101,977,540 |
| ලී බඩු හා සවි කිරීම් | - | 6,695,471 | 15,936,803 |
| **පුනරාවර්තන** | | | |
| පුහුණු | - | 56,423,884 | 157,067,556 |
| පරිපාලන වියදම | - | 6,238,849 | 14,728,392 |
| ලිපි ද්‍රව්‍ය | 222,012 | 619,581 | 1,057,394 |
| ප්‍රවාහන | - | 882,331 | 1,493,405 |
| විවිධ වියදම් | - | 281,146 | 1,309,433 |
| උපදේශක | - | 33,250,293 | 33,250,293 |
| එකතුව | 222,012 | 217,923,499 | 545,026,231 |

2.2 **විශේෂ (ඩොලර්) ගිණුම - ගිණුම් අංකය (එස්වල් 137)**

------------------------------------------------------------

ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තා අනුව සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2012 මාර්තු 31 දිනෙන් අවසන් මාස 03 ක කාලපරිච්ජේදය හා 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වා තිබුණු විශේෂ (ඩොලර්) ගිණුමේ මෙහෙයුම් පහත දැක්වේ.

| විස්තරය | 2012 මාර්තු 31 දිනෙන් අවසන් මාස 03 ක කාලපරිච්ජේදය සඳහා | | 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | |
|---|---|---|---|---|
| | එ.ජ.ඩො. | රු. | එ.ජ.ඩො. | රු. |
| ජනවාරි 01 දිනට ශේෂය | 1,047,814 | 119,347,351 | 880,815 | 97,729,067 |
| එකතු කළා | | | | |
| ඌන පූර්ණය කිරීම් | නැත | නැත | 1,410,000 | 156,476,724 |
| විදේශ විනිමය වාසිය | - | 1,082,130 | - | 2,700,832 |
| | 1,047,814 | 120,429,481 | 2,290,815 | 256,906,623 |
| අඩු කළා: | | | | |
| ආපසු ගැනීම් | 972,309 | 110,750,678 | 1,243,001 | 137,559,272 |
| මාර්තු / දෙසැම්බර් 31 දිනට ශේෂය | 75,505 | 9,678,803 | 1,047,814 | 119,347,351 |

## 3. විගණන නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

3.1 සැලකිය යුතු කාර්යයක් නොමැති වුවද සමාලෝචිත වර්ෂයේ මාස 03 ක කාලයක් සඳහා නිලධාරීන් 08 දෙනෙකුට රු. 597,820 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද මෙම වියදම ගිණුම්වලට ගෙන නොතිබුණි.

3.2 **කාර්ය සාධනය**

2012 මාර්තු 31 දිනට ව්‍යාපෘතියේ කාර්යයන්වල මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ.

| | වියදම් වර්ගය | ප්‍රතිපාදනය<br>රු. මිලියන | තථ්‍ය වියදම<br>රු. මිලියන | ප්‍රගතිය<br>% |
|---|---|---|---|---|
| 01. | වැඩ | 898.0 | 218.2 | 24.3 |
| 02. | භාණ්ඩ | 158.3 | 117.9 | 74.5 |
| 03. | උපදේශක | 192.7 | 33.2 | 17.2 |
| 04. | පුහුණු | 285.4 | 157.1 | 55.0 |
| 05. | ව්‍යාපෘති කළමනාකරණය | 39.2 | 18.6 | 47.4 |
| | එකතුව | 1,573.6 | 545 | 34.6 |

3.3 නාගරික සංවර්ධන අධිකාරිය විසින් දරන ලද ඉඩම සංවර්ධනය සඳහා පිරිවැය, සමීක්ෂණ කටයුතු සහ වන්දි ගෙවීම් වෙනුවෙන් රු. මිලියන 100 ක අත්තිකාරමක් 2008 සැප්තැම්බර් මාසයේ ගෙවා

තිබුණි. එම අධිකාර්ය වෙත පවරන ලද කාර්ය සම්පූර්ණ වී තිබුණද වැය කළ පිරිවැය අඩු කරගෙන ඉතිරි මුදල ආපසු එවා නොතිබුණි.